**2019 සැප් 26 බ්‍රහස්පතින්දා**

World Clock (https://www.worldtimeserver.com/current_time_in_LK.aspx)
|
Currency Rates (https://www.oanda.com/currency/converter/)
|
Weather (http://worldweather.wmo.int/en/country.html?countryCode=84)

(/daily/../sunday) (http://www.island.lk/) (http://www.navaliya.com/) (http://www.vidusara.com/)
(http://epaper.divaina.com/) (/daily/index.php/classifieds) (/daily/images/rahu__new.jpg)

(https://www.mobitel.lk/si/speedtest)

(/daily/images/advertisments/2018/09/17/DAMBADIWA-divaina.jpg)

# ඉතිහාසයේ ප්‍රථම වරට ජනාධිපති අපේක්ෂකයන් එකම වේදිකාවකට

පළකරන ලද්දේ: **September 26 2019**
**Views 501**



* මාර්තු 12 ව්‍යාපාරයේ වැඩක්

* දේශපාලනඥයින් අතර කිසියම් සංහිඳියාවක් ඇති කිරීම අපේ අරමුණයි - රෝහණ හෙට්ටිආරච්චි

ඉතිහාසයේ ප්‍රථම වරට මෙවර ජනාධිපතිවරණයට තරග කරන සියලු අපේක්ෂකයන් එකම වේදිකාවකට කැඳවීමට පැෆරල් සංවිධානය ප්‍රමුඛ මාර්තු 12 ව්‍යාපාරය කටයුතු කරමින් සිටී. ලබන මස 05 වැනිදා පැවැත්වෙන මෙම වැඩසටහන පිළිබඳව පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා සමඟ කළ සාකච්ඡාවකි මේ.

ප්‍රශ්නය - ඇයි ඔබ ඔක්තෝබර් 05 දේශපාලනයේ හැරවුම් ලක්ෂ්‍යයක් කියන්නේ?

පිළිතුර - ශ්‍රී ලංකාවේ මැතිවරණ ඉතිහාසයේ කිසිම දවසක ජනාධිපති අපේක්ෂකයෝ සියලු දෙනාම එකම වේදිකාවට ඇවිල්ල ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් ඉදිරිපත් කිරීමක් මීට කලින් වෙලා නැහැ.

ප්‍රශ්නය - මොකක්ද මේකෙ අරමුණ ?

පිළිතුර - මේකෙ අරමුණු කිහිපයක් තිබෙනවා.

පළවැනි එක තමයි මාර්තු 12 ව්‍යාපාරය ලබාදෙන ප්‍රශ්න ඒ ඒ දේශපාලන පක්ෂවල බුද්ධි මණ්ඩල තුළ සාකච්ඡා කිරීම හරහා ජයග්‍රහණයෙන් පසු ඒවා ක්‍රියාත්මක කිරීමට ඔවුන් තුළ යම් සැලැස්මක් හා එකඟතාවයක් ඇති කිරීම.

දෙවැනි එක තමයි ශ්‍රී ලංකාවේ ජනතාවගේ ජන ජීවිතයට, රටේ පැවැත්මට බලපාන ප්‍රධාන ප්‍රශ්නවලට අපේක්ෂකයන් ලබාදෙන විසඳුම් එකම වේදිකාව සිට ප්‍රකාශ කිරීම හරහා ජනතාවට තම අපේක්ෂකයන් පිළිබඳව යම් තක්සේරුවක් ලබා ගැනීමට අවස්ථාව ලබාදීම.

තුන්වැනි එක තමයි මෙම අපේක්ෂකයන් 5000 ක් පමණ ජනතාවක් ඉදිරියේ මුළු රටටම එකවර ඔවුන්ගේ වැඩපිළිවෙළ ප්‍රකාශ කිරීම හරහා ඔවුන් ජනතාව සමග මේවා ක්‍රියාත්මක කිරීමට යම් බැඳීමක් ඇතිකර වීම.

හතරවැනි එක තමයි විවිධ දේශපාලන මතවාද ප්‍රතිපත්ති අනුගමනය කරන පිරිස් එකම මේසයකට කැඳවීම හරහා දේශපාලනඥයින් අතර කිසියම් සංහිඳියාවක් ඇති කිරීමත්, ඒ හරහා ජනතාව තුළ ද දේශපාලන භේදයකින් තොරව මැතිවරණ ව්‍යාපාරය සාමකාමීව ගෙනයාම සඳහා පණිවිඩයක් ලබාදීම.

ප්‍රශ්නය - 5 වෙනිදා මොකද වෙන්නේ?

පිළිතුර - 5 වැනිදා කාරණා කිහිපයක් සිද්ධ වෙනවා.

එකක් තමයි, සිහින ජනපති තේමාව යටතේ මාර්තු 12 ව්‍යාපාරය රටපුරා ගෙනගිය සංවාද මාලාවෙන් ජනපතිවරයකුට තිබිය යුතු ගුණාංග පිළිබඳව ඔවුන් දැක්වූ අදහස් සමාජගත කිරීමක් වෙනවා.

තවත් එකක්, ඒප්‍රියල් තරුණ ජාලය පුහුණු කළ පුරවැසි නිරීක්ෂකයන් 3000 ක් හඳුන්වා දීම සිද්ධ වෙනවා.

ඊළඟ එක තමයි අපේක්ෂකයන් සියලු දෙනා එකම වේදිකාවේ පොදු ප්‍රශ්නවලට උත්තර සැපයීමක් වෙනවා.

ඒ වගේම මැතිවරණ ව්‍යාපාරය සාමකාමී හා නිදහස්ව පවත්වන්නට දේශපාලන පක්ෂ අතර එකඟතාවයක් සකස් වෙනවා.

ප්‍රශ්නය - මේ වගේ ප්‍රසිද්ධ සංවාදයකදී දේශපාලන පක්ෂ අපහසුතාවයට පත්වෙන්නෙ නැද්ද?

පිළිතුර - කිසිසේත්ම නැහැ.

පළමු වතාවට මාර්තු 12 ව්‍යාපාරය සිදුකරන මෙම වැඩසටහන හරහා කිසිදු ආකාරයකට අපේක්ෂකයන් අපහසුතාවයට පත්වෙන්නට අප ඉඩකඩ සපයන්නෙ නැහැ.

අදාළ ප්‍රශ්න අපි අපේක්ෂකයන්ට කල් ඇතිව යවනවා. ඔවුන්ට සම්පූර්ණ සූදානම් වෙලා එන්න පුළුවන් ඒවාට උත්තර දෙන්න. එක ප්‍රශ්නයකට ඔවුන්ට කැමැති නම් ඒ මොහොතේ තෝරා ගන්නත් පුළුවන්. ඒ වගේම විනාඩි 03 ක නිදහස් කාලයක් හැමෝටම ලැබෙනවා. තමන්ගෙ සමස්ත වැඩපිළිවෙළ රටට කියන්න. ඒ හරහා අවස්ථාව උදා වෙනවා. ඒ වගේම සහභාගි වන පිරිසට කිසිදු ආකාරයකට ප්‍රශ්න ඇසීමට හෝ අපේක්ෂකයන්ට බාධා කිරීමට අපි ඉඩකඩ තබන්නේ නැහැ.

ප්‍රශ්නය - මේ සංවාදය ජනතාවට ගෙනියන්න තියෙන සැලසුම මොකද්ද?

පිළිතුර - දැනටමත්, ජාතික රූපවාහිනිය, සිරස, හිරු, දෙරණ හා ස්වර්ණවාහිනී නාලිකා මේ සංවාදය සජීවීව විකාශය කරන්න එකඟ වෙලා තිබෙනවා. අපි විශ්වාස කරනවා අනෙකුත් රූපවාහිනී නාලිකා, ගුවන් විදුලි නාලිකා, ඒ වගේම මුද්‍රිත මාධ්‍ය හා සමාජ මාධ්‍ය ජාලා මේ වැඩසටහන සමාජගත කිරීමේ වගකීම ඉෂ්ට කරයි කියලා.

සාකච්ඡා කළේ - රනිල් ධර්මසේන



( https://www.facebook.com/livguardsrilanka/)

## ප්‍රාදේශීය පුවත් (/daily/index.php/pradeshiyapuwath)

### ජනපති නියෝගයෙන් යෝෂිත යළි නාවික හමුදාවට (/DAILY/INDEX.PHP/PRAPUWATH/33755-2019-09-25-12-35-75)

Sep 26 2019 00:00 Views 1056



(/daily/index.php/pradeshiya-puwath/33755-2019-09-25-12-35-75)
වසර තුනකට අධික කාලයක් සේවය අත්හිටුවා තිබූ ලූතිනන් යෝෂිත රාජපක්ෂ මහතා යළි සේවයට බඳවා ගැනීමට නාවික හමුදාව පියවර ගෙන ඇත. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ලබාදුන් නියෝගයකට අනුව ලූතිනන් යෝෂිත රාජපක්ෂ යළි සේවයට බඳවා...

### නිවාස අහිමි ලක්ෂ 25 ක ජනතාවකට ආදර්ශ ගම්මාන විසිපන්දහසක් නිර්මාණය කිරීම මගේ වගකීමයි - නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු ඇමැති සජිත් ප්‍රේමදාස (/DAILY/INDEX.PHP/PRAPUWATH/33754-2019-09-25-12-35-74)

Sep 26 2019 00:00 Views 151



(/daily/index.php/pradeshiya-puwath/33754-2019-09-25-12-35-74)
නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශය අනුග්‍රහය යටතේ නිවාස සංවර්ධන අධිකාරියේ මෙහෙය වීමෙන් දිවයින පුරා ඉදිකෙරන ආදර්ශ ගම්මාන ව්‍යාපෘතියට අයත් තවත් ආදර්ශ ගම්මානයක් වාරියපොල මැතිවරණ කොට්ඨාසයේ පාදෙණිය, නරමාන ප්‍රදේශයේ නවන්ගම නමින් ඉදිකර පවුල් **14** ක ජනතාවක් වෙත...

---

## බෞද්ධයින්ට අයිති නෑ - ගුරුකන්ද විහාරය කෝවිලට දෙනු වවුනියාවේ උද්ඝෝෂණ (/DAILY/INDEX.PHP/PRAPUWATH/33753-2019-09-25-12-35-73)

Sep 26 2019 00:00 Views 1231



(/daily/index.php/pradeshiya-puwath/33753-2019-09-25-12-35-73)
මුලතිව් නායාරු ගුරුකන්ද බෞද්ධ විහාරය බෞද්ධයින්ට අයත් නැති බව කියමින් සහ එහි අයිතිය ඒ අසල පිහිටි නීරාවිඅඩි පිල්ලයාර් කෝවිලට ලබාදෙන ලෙස ඉලමින් වවුනියාවේ සංවිධාන කීපයක් **24** දා සවස උද්ඝෝෂණයක නිරත වූහ. යුද සමයේදී අතුරුදහන්...

---

## තොටවත්ත හරස් මාර්ගයට වෑන් එක දමන විට “ඔන්න කෝච්චියක් ” කියා නංගී කෑගැසුවා - මාව උඩින් ගිහින් කාණුවකට වැටුණා (/DAILY/INDEX.PHP/PRAPUWATH/33752-2019-09-25-12-35-72)

Sep 26 2019 00:00 Views 988



(/daily/index.php/pradeshiya-puwath/33752-2019-09-25-12-35-72) - වෑන් රථ රියැදුරු සාක්ෂි දෙයි - වතුගෙදර දුම්රිය වෑන් රථ අනතුරින් මිය ගිය මවගේ සහ පුතුගේ මරණ පරීක්ෂණය ‘තොටවත්ත දුම්රිය හරස් මාර්ගයට වෑන් රථය දමන විට ‘ඔන්න කෝච්චියක්, ඔන්න කෝච්චියක්’ කියලා නංගී කෑ...

---

## බාල වයස්කාර දරුවාට අතවර කළ **63** හැවිරිදි විත්තිකරු වසර **30** ක් හිරේ (/DAILY/INDEX.PHP/PRAPUWATH/33733-2019-09-25-15-10-35)

Sep 26 2019 00:00 Views 446